සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

66 S I

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

First Term Test - Grade 13- 2019

විභාග අංකය .............................

# ජෛව පද්ධති තාක්ෂණවේදය I

කාලය පැය දෙකයි

උපදෙස්
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර** තෝරාගෙන එය සපයා දෙන කොටු පත්‍රයේ කතිරයක් (X) යොදා දක්වන්න.

01. දිනපතා උදේ (8.30) හා සවස (3.30) දත්ත එකතු කරනු ලබන කාලගුණික පරාමිතීන් වන්නේ,
1. වර්ෂාපතනය හා සාපේක්ෂ අර්ද්‍රතාව
2. සුළඟේ වේගය හා දිශාව
3. සාපේක්ෂ ආර්ද්‍රතාව හා වාෂ්පීකරණය
4. පාංශු උෂ්ණත්වය හා වායුගෝලීය පීඩනය
5. පාංශු උෂ්ණත්වය හා දවසේ උපරිම උෂ්ණත්වය

02. දේශගුණික සාධකවල බලපෑම් පිළිබඳව අසත්‍ය ප්‍රකාශය වන්නේ,
1. මහා බාධක කොරල්පරය මිය යාම, සාගර උෂ්ණත්වය ඉහළ යාමේ ප්‍රතිඵලයකි.
2. උත්කුපායනය, මත්ස්‍ය සම්පත අධික වීමට බලපාන හේතුවකි.
3. ආලෝකය, ශාකවල රසායනාවර්තී චලන සඳහා වැදගත් වේ.
4. ඉහළ පීඩන තත්ව යටතේ, වළාකුළු වර්ධනය නොවන නිසා වැසි රහිත තත්ත්ව ඇතිවේ.
5. දිවා කාලයේ දිග වැඩිවන විට, කිකිළියන්ගේ ලිංගික පරිණතිය ඉක්මන් වේ.

03. ආහාර නරක් වීම.
1. එන්සයිමීය ක්‍රියාකාරීත්වය නිසා සිදු නොවේ.
2. මේද මුඩුවීම නිසා සිදුවිය හැක.
3. අඩු උෂ්නත්ව මගින් සැමවිටම නිශේධනය කළ හැක.
4. පෙර අස්වනු සාධක බල නොපායි.
5. බෝ නොවන රෝග බොහොමයකට හේතු සපයයි.

04. පසක, මැටි ප්‍රමාණය වැඩිවීම සමග,
1. කැටායන හුවමාරු ධාරිතාව අඩුවේ.
2. සච්ඡිද්‍රතාව වැඩිවේ.
3. දෘශ්‍ය ඝනත්වය වැඩිවේ.
4. ජලය රඳවා ගැනීමේ ධාරිතාව අඩුවේ.
5. ඛාදනය අඩුවේ.

05. රුධිරගත කොලෙස්ටරෝල් මට්ටම ඉහළ රෝගීන් සඳහා සැකසුන මේද රහිත කිරිපිටි පිළිබඳව සත්‍ය වන්නේ,
1. ප්‍රබල කිරීමකි.
2. අගය එකතු කිරීමකි.
3. සරු කිරීමකි.
4. සුබ්‍රිකරණයකි.
5. අගය එකතු කිරීම හා විසිරී වියළීමකි.

06. බ්‍රොයිලර් කුකුළු කර්මාන්තයේදී වායු දූෂණය අවම කිරීමට යොදා ගත හැකි වඩාත්ම යෝග්‍ය ක්‍රියාව වනුයේ,
1. සංවර්ධන නිවාස භාවිතා කිරීමය.
2. සුදුසු අතුරනු ද්‍රව්‍ය භාවිතය.
3. අතුරනුව සතියකට වරක් රේක්ක කිරීමය.
4. ජල බඳුන්වලින් ජල කාන්දුව හා පිටාර ගැලීම වැළැක්වීමය.
5. පිටර පංකා හඳුන්වාදීමය.

07. ශ්‍රී ලංකාවේ බහුලම මහා පස් කාණ්ඩ දෙක වනුයේ,

1. රතු දුඹුරු පස හා දිය සිළු පසයි. 2. රතු දුඹුරු පස හා රතු කහ පොඩ්සොලික් පසයි.
3. රතු දුඹුරු පස හා ලැටරයිට් පස වේ. 4. රතු කහ පොඩ්සොලික් පස හා දියසිළු පසයි.
5. දිය සිළු පස හා ලැටරයිට් පස වේ.

08. දැවමය නොවන වනජ නිෂ්පාදන සඳහා ගැනෙන ශාක වර්ග වනුයේ,

1. රබර්, කිතුල්, පැපොල් හා කොහොඹ ය.
2. කිතුල්, වේවැල්, සුදුහඳුන් හා කොහොඹ ය.
3. කුරුඳු, කිතුල්, කොහොඹ හා වේවැල් ය.
4. සුදු හඳුන්, වේවැල්, පැපොල් හා කිතුල් ය.
5. වේවැල්, පැපොල්, රබර් හා කිතුල් ය.

09. දුම්ගැස්සවීම මගින් පරිරක්ෂණය කරනු ලබන ආහාර මතුපිට තැන්පත් වන ප්‍රතිඔක්සිකාරකය වනුයේ,

1. බෙන්සොඒට් 2. නයිට්‍රයිට 3. ෆීනෝලික සංයෝග
4. සෝබේට් 5. BHA

10. තිරස් දුර මනිනු ලබන උපකරණයකි.

1. ස්ප්‍රීතු ලෙවලය. 2. ඔඩොමීටරය 3. ප්ලැනි මීටරය
4. රිෆ්‍රැක්ටොමීටරය 5. තලමේසය

11. අපජල පවිත්‍රණ ක්‍රියාවලියේ ද්විතියික පිරියම් කිරීමේ දී,

1. කාබනික ද්‍රව්‍ය වියෝජනය සඳහා නිර්වායු බැක්ටීරියා යොදා ගැනේ.
2. සක්‍රිය රොන්බොර සුළු කොටසක් ප්‍රාථමික රොන්බොර සමඟ නිර්වායු වියෝජනයට ලක් කෙරේ.
3. සක්‍රිය රොන්බොර වැඩි කොටසක්, ද්විතියික පිරියම් ඒකකයට යොමු කෙරේ.
4. ක්ෂුද්‍ර ජීවීන් ජලයේ අවලම්බනය වීමෙන්, සම්පිණ්ඩනයක් (floc) සෑදේ.
5. ප්‍රාථමික රොන්බොර අවසාදන තටාකවල තැන්පත් වීම කාර්යක්ෂම කෙරේ.

12. ශිෂ්‍යයකු විසින් 1:10000 පරිමාණයේ සිතියමක් මත නගර දෙකක් අතර දුර මනිනු ලදුව, එම දුර ප්‍රමාණය සිතියම මත 7.2cm බව දැන ගන්නා ලදී. ඒ අනුව භූමිය මත එම නගර දෙක අතර පවතින සත්‍ය දුර වන්නේ,

1. 0.072 km 2. 0.72 km 3. 7.2 km 4. 72 km 5. 720 km

13. තැලීම් හා තෙරපීම් සඳහා ප්‍රතිරෝධී පැපොල් ප්‍රභේදය වන්නේ,

1. රත්න 2. බ්ලූ ලේඩි 3. ඇත් දළ 4. කිරිකවඩි 5. තිලිණ

14. වාණිජ තවාන් පැළ නිෂ්පාදනයේ දී,

1. පැළ දැඩිකිරීම සඳහා ජල සම්පාදන කාලාන්තරය වැඩි කළ යුතු වේ.
2. වාරි ජලය සමඟ කාබනික පොහොර හා රසායනික පොහොර මිශ්‍රව යෙදිය යුතු වේ.
3. ජල සම්පාදනය සඳහා බිංදු ජල සම්පාදනය උචිත වේ.
4. මිහිදුම් ආකාර ජල සම්පාදනය නුසුදුසු වේ.
5. ජල සම්පාදන කාලාන්තරය හා ශාකවල උස පිළිබඳව වාර්තා තබා ගත යුතු වේ.

15. ක්ෂුද්‍ර ප්‍රචාරණය යනු,

1. දූෂක වියෝජනයට යොදා ගන්නා ක්ෂුද්‍රජීවී ප්‍රචාරණ ක්‍රමයකි.
2. ක්ලෝන ලබා ගත හැකි ප්‍රචාරණ ක්‍රමයකි.
3. නව ප්‍රභේද ලබා දෙන ප්‍රචාරණ ක්‍රමයකි.
4. වර්ධක ප්‍රචාරණ ක්‍රමයක් නොවේ.
5. පටක රෝපණ ක්‍රමයක් නොවේ.

16. සංසරණය වන නිර්පාංශු වගා මාධ්‍යයේ ප්‍රශස්ත EC අගය පහළ බැසීමට නිවැරදි හේතුව විය හැක්කේ,

1. ජලය වාෂ්ප වී තිබීම. 2. උෂ්ණත්වය ඉහළ යාම.
3. පෝෂක හිඟ වීම. 4. වාතනය නොලැබීම.
5. පොම්ප ක්‍රියාකාරීත්වය ඇන හිටීම.

17. කායික විද්‍යාත්මක පරිණතියට පත් වූ පසු අස්වනු නෙලන බෝගයක් වන්නේ,

1. මිදි  2. අඹ  3. බණ්ඩක්කා  4. ගස්ලබු  5. වම්බටු

18. ජලයේ උෂ්ණත්වය පිළිබඳ සත්‍ය ප්‍රකාශය වනුයේ,
1. කාබනික ද්‍රව්‍ය හා අකාබනික ද්‍රව්‍ය ජලයට එකතු වීම නිසා උෂ්ණත්වය පහළ බසී.
2. වායුගෝලීය උෂ්ණත්වය පහළ යාම, ජලයේ උෂ්ණත්වය ඉහළ යාමට හේතුවේ.
3. උෂ්ණත්වය වැඩිවන විට ද්‍රාව්‍ය ඔක්සිජන ප්‍රමාණයද වැඩිවේ.
4. ජලාශයක උෂ්ණත්වය වැඩිවීම හා pH අගය අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයක් පවතී.
5. ජලයේ උෂ්ණත්වය වැඩි වන විට, ජීවීන්ගේ පරිවෘත්තිය සීඝ්‍රතාව අඛණ්ඩව අඩුවේ.

19. දම්වැල් බිම් මැනුවේදී,
1. තිරස් දුර හා කෝණ මනිනු ලැබේ.
2. සිරස් තලයේ හා තිරස් තලයේ කෝණ මනිනු ලැබේ.
3. ඉඩම ත්‍රිකෝණවලට බෙදාගනු ලැබේ.
4. ඍජු අනුලම්බ පමණක් ලබා ගනී,
5. දත්ත වැඩි සංඛ්‍යාවක් සහිත ඉඩම් සඳහා යෝග්‍ය ය.

20. ශ්‍රී ලංකාවේ ජල සංචායක පිළිබඳ ප්‍රකාශ තුනක් පහත දැක්වේ.
A - ආටීසියානු හා ආටීසියානු නොවන ජල සංචායක මහ කන්නයේ වර්ෂාපතනයෙන් පුනරාරෝපණය වේ.
B - ආටිසියානු ජල ධරය අපරාගම්‍ය පාෂාණ ස්ථර දෙකකින් මායිම් වී ඇත.
C - උළැඟි වසර පුරා ඒකාකාරිව ජලය සැපයිය හැකි ජලධරයකි.
ඉහත ප්‍රකාශ අතරින් සත්‍ය වන්නේ,
1. A පමණි.  2. B පමණි.  3. C පමණි.
4. A හා B පමණි.  5. A හා C පමණි.

21. ඉන්කියුබේටරය තුළ දී කුකුළු පැටවුන්ට බෝවිය හැකි රෝගයක් වනුයේ,
1. යෝක් සැක්  2. පුල්ලෝරම්  3. රැනිකට්
4. මැස්ටයිටීස්  5. කොක්සිඩියෝසිස්

22. ඉහත රූපයෙන් පෙන්වන දැවවල ශක්ති ආකාරය වන්නේ,



1. සම්පීඩන ප්‍රබලතාවය යි.
2. ආතන්‍ය ප්‍රබලතාවය යි.
3. විරූපන ප්‍රබලතාවය යි.
4. නම්‍ය ප්‍රබලතාවය යි.
5. අනම්‍ය ප්‍රබලතාවය යි.

23. ඉහළ ජල සක්‍රියතා අගයක් දරන ආහාරයක් වන්නේ,
1. විසිරි වියලන ලද කිරි  2. සොසේජස්  3. බිස්කට්
4. විජලනය කරන ලද එළවළු  5. සාන්ද්‍ර පළතුරු යුෂ

24. කුකුළු නිවාසයක බිම සඳහා වඩාත් යෝග්‍ය වන්නේ,
1. ලීවලින් තැනූ බිමකි.  2. ගඩොල් ඇතිරූ බිමකි.  3. රළු ගල් ඇතිරූ බිමකි.
4. සුමට සිමෙන්ති බිමකි.  5. සුමට මැටි බිමකි.

25. ට්‍රැක්ටර්වල බල සම්ප්‍රේෂණ පද්ධතියට ඇතුළත් වන කොටස් අතරින් සිව්රෝද ට්‍රැක්ටර්වල පමණක් අඩංගු වන ඒකකය වන්නේ,
1. ජව රෝදය  2. ක්ලචය  3. නිම් එළවුම
4. අක්ෂ දණ්ඩ  5. ගියර පෙට්ටිය

26. ස්ථානීය නොවන ජල දූෂණය,
1. සුපෝෂණයට දායක වන එකම ප්‍රභවය වේ.
2. ප්‍රදේශයේ පාරිසරික තත්ව මත රඳා නොපවතී.
3. කුඩා ප්‍රමාණයේ දූෂණ කාරක සමූහයක් එකතු වීමෙන් සෑදේ.
4. සැමවිටම යම්කිසි නිෂ්පාදන හෝ සැකසීමේ ක්‍රියාවලියකට සම්බන්ධ වේ.
5. හට ගන්නා ස්ථානයේ දී පාලනය කළ හැකිය.

27. පාංශු කාබනික ද්‍රව්‍ය,
1. පාංශු වයනය දියුණු කරයි.
2. වල්පැල පාලනය කරයි.
3. සත්‍ය ඝනත්වය වැඩි කරයි.
4. ජලඅවශෝෂණ ධාරිතාව වැඩි කරයි.
5. පසේ ඒකක පරිමාවක ස්කන්ධය ඉහළ දමයි.

28. බහුරෝපිත මත්ස්‍ය වගාව පිළිබඳ වගන්ති කීපයක් පහත දැක්වේ.
A - පොකුණේ හැම ස්ථරයක්ම ආවරණය වන පරිදි මත්ස්‍ය විශේෂ කිහිපයක් තැන්පත් කෙරේ.
B - මසුන් අතර ආහාර හා ඉඩකඩ සඳහා තරගයක් ඇතිවේ.
C - කැට්ලා, සිල්වර් කාප්, රෝහු හා මිරිගාල් වැනි මත්ස්‍ය විශේෂ යොදා ගත හැකිය.
D - ජලයේ ගුණාත්මය පිළිබඳ නිරන්තර අවධානයක් තිබිය යුතුය.
ඉහත ප්‍රකාශ අතරින් සත්‍ය වන්නේ,
1. A හා B පමණි.
2. B හා C පමණි.
3. A හා C පමණි.
4. A, B හා D පමණි.
5. A, C හා D පමණි.

29. ආහාර විෂ වීම සිදුවිය හැකි ආහාර සතු රසායනික සාධකයක් වන්නේ,
1. බ්‍රෝමලින්
2. පොලිෆිනෝල් ඔක්සිඩේස්
3. බෙන්සයිල් ඇමයිනො පියුරින්
4. මොනො සෝඩියම් ග්ලූටමේට
5. ඇෆ්ලටොක්සින්

30. ලක්ෂ්‍ය 02 ක් අතර මට්ටම් ගැනීමේ දී හැරවුම ලක්ෂ්‍යයක් පහත රූප සටහනේ දැක්වේ. උපකරණයේ උසෙහි වෙනස වන්නේ,




1. 1.25 + 3.75 m
2. 2.32 + 3.75 m
3. 2.32 + 1.25 m
4. 3.75 - 1.25 m
5. 3.75 - 2.32 m

31. පහත දැක්වෙන ක්‍රම අතරින් භූ ජල පුනරෝපණය වැඩි කරගත හැකි ක්‍රියාමාර්ගයක් වනුයේ,
A - යටි පස බුරුල් කිරීම.
B - ජල වහන කානු සැකසීම
C - පසේ අහඹු රළු බව වැඩි කිරීම.
D - ශාක වැස්ම වැඩි කිරීම.
ඉහත ප්‍රකාශ අතරින් සත්‍ය වන්නේ,
1. A හා B පමණි.
2. C හා D පමණි.
3. B හා D පමණි.
4. A හා D පමණි.
5. B, C හා D පමණි.

32. ආරක්ෂිත ගෘහයක් තුළ යොදා ගනු ලබන කෘමි හා රෝග ප්‍රතිරෝධී තාක්ෂණික ශිල්පීය ක්‍රමයක් වන්නේ,
1. දෙදුරුම්ජනක භවිතය
2. UV ප්‍රතිරෝධි දැල් භාවිතය.
3. ඇලවෙන උගුල් යෙදීම.
4. ෆෙරමෝන උගුල් යෙදීම.
5. බඹබල් මී මැස්සන්ගේ ජනාවාසයක් සෑදීම.

33. ශුෂ්කකරණයේ දී තවදුරටත් ආහාරයේ කොළ පැහැය රැක ගැනීමට යෙදිය හැකි රසායනික ද්‍රව්‍ය වන්නේ,
1. SMS
2. මොනොසෝඩියම් ග්ලූටමේට්
3. බ්‍රෝමලින්
4. රැටෝන
5. ඔක්සීන

34. ශ්‍රී ලංකාවේ වාණිජ කුකුල් මස් නිෂ්පාදනය සඳහා යොදා ගැනෙන සංවෘත නිවාස පද්ධති පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ

A - මෙම පද්ධතියේ දී එක් සතෙකු සඳහා ලබා දෙන ඉඩ ප්‍රමාණය විවෘත නිවාස පද්ධතිවල ලබා දෙන ඉඩ ප්‍රමාණයට වඩා අඩුය.

B - නිවාස ඇතුළත ස්වයංක්‍රීයව පාලනය වන පරිසර තත්ත්ව සතුන් සඳහා සුවපහසු පරිසරයක් පවත්වා ගනී.

ඉහත ප්‍රකාශ අතරින්,

1. A පමණක් සත්‍ය වේ.
2. B පමණක් සත්‍ය වේ.
3. A සත්‍ය වන අතර B මගින් A පැහැදිලි කරයි.
4. B සත්‍ය වන අතර A මගින් B පැහැදිලි කරයි.
5. A සත්‍ය වන අතර B අසත්‍ය වේ.

35. ගොවි මහතෙකු සතුව ටැංකි ධාරිතාව 12L වූ නැප්සැක් ඉසින යන්ත්‍රයක් ඇත. ඔහුගේ හෙක්ටයාර එකක් වූ ක්ෂේත්‍රයේ වල් පැල පාලනය සඳහා 2 - 4 - D වල් නාශක ලීටර් 1.2 ක් යෙදීමට අවශ්‍යව ඇත. ඔහුගේ ක්ෂේත්‍රයට වල්නාශක මිශ්‍රණයෙන් 120L යොදන ලෙස නිර්දේශ කර ඇත. එක් ටැංකියක් සඳහා මිශ්‍ර කළ යුතු 2 - 4 - D ප්‍රමාණය වනුයේ,

1. 0.12 ml 2. 12.0 ml 3. 1.2 ml 4. 120 ml 5. 1200 ml

36. ශ්‍රී ලංකාවේ පෝෂණ ලේබල් කිරීමෙන් නිදහස් කළ ආහාර ඇතුළත් පිළිතුර වන්නේ,

1. ටොපි, රසකැවිලි, යෝගට් හා ටින්කල මාළුය.
2. බිස්කට්, ටොපි දියරකිරි හා මීට් බෝල්ස් ය.
3. පළතුරු යුෂ, ජෑම්, බටර් සහ කෝඩියල් ය.
4. පළතුරුයුෂ, ටොපි, බිස්කට් හා පානීය ජල බෝතලය
5. යෝගට්, ජෑම්, පළතුරු යුෂ හා සොසේජස් ය.

37. ආහාරයක සෞඛ්‍ය ආරක්ෂිත බව සැළකීමේ දී ජෛවීය උපද්‍රවකාරී අපවිත්‍රකාරකයකට උදාහරණයක් වන්නේ,

1. එන්සයිම 2. වැලි 3. දුහුවිලි 4. $Pb$ ඊයම් 5. දිලීර

38. පහත රූප සටහනේ A ලෙස නම් කරන ලද කොටසේ කාර්යය වන්නේ ?

1. ජලය ඉහළට ඇද ගැනීමය.
2. ජලය ටැංකිය වෙත සැපයීමය.
3. කේන්ද්‍රය අසළ රික්තකයක් නිර්මාණය කිරීමය.
4. ජලය මගින් ඇති කරන පීඩනයට ප්‍රතිරෝධය සැපයීම.
5. චූෂණ කපාටය විවෘත කිරීමය.




39. බිත්තරවල ගුණාත්මය මැනීමේ දී ''හෝ ඒකක අගය'' (Haugh Units Score) වැදගත් වේ. එය මැනීම සඳහා භාවිතා කරනු ලබන පරාමිති වන්නේ.,

1. ඝන ඇල්බියුමින් ස්ථරයේ දිග හා එහි විෂ්කම්භය වේ.
2. කහ මදයේ උස හා එහි විෂ්කම්භය වේ.
3. ඝන ඇල්බියුමින් ස්තරයේ උස හා බිත්තියේ බර වේ.
4. කහ මදයේ උස හා බිත්තරයේ බර වේ.
5. ඝන ඇල්බියුමින් ස්තරයේ උස හා කහමයේ උස වේ.

40. පහත රූප සටහනේ දැක්වෙන යන්ත්‍රය වන්නේ,

1. තැටි නගුලය.
2. උපපස් නගුලය
3. ජපන් පරිවර්ත්‍ය නගුලය
4. රොටොවේටරය
5. අතුරුයත් ගෑමේ උපකරණයක්



41. ස්නේහක තෙල් පිළිබඳ ප්‍රකාශ කීපයක් පහත දැක්වේ.
A - ඉහළ දුස්ස්‍රාවිතාවයකින් යුක්ත විය යුතුය.
B - ගෙවී යන ලෝහ කොටස් හා ක්ෂුද්‍ර අංශු ස්නේහක තෙල් මගින් රැස් කෙරේ.
C - ක්‍රියාකාරී කොටස් අතර ඝර්ෂණය වැඩි කරයි.
ඉහත ප්‍රකාශ අතරින් සත්‍ය වන්නේ,
1. C පමණි. 2. A හා C පමණි. 3. B පමණි.
4. A හා B පමණි. 5. A,B,C කිසිවක් නොවේ.

42. බිංදු ජල සම්පාදනය,
1. ක්ෂේත්‍ර බෝගවල පත්‍ර නොවැළැක්විය හැකි තෙමීමකට මග පාදයි.
2. වාෂ්පීකරණ හානි ඇති කරමින් සුළඟට ඉහළ සංවේදිතාවයක් පෙන්නුම් කරයි.
3. මගින් ජලය හා පෝෂක වඩාත් කාර්යක්ෂම ලෙස ක්ෂේත්‍රයට යොදන බැවින් ක්ෂේත්‍රයේ වල් වර්ධනය වැඩි විය හැක.
4. ලවණ ජලය සමඟ යෙදූ විට බෝග ශාකවල පත්‍ර පිළිස්සීම සිදුවේ.
5. ජල පෙරහන් රහිතව යොදාගත් විට ජල විමෝචක අවහිර වීමට හේතු විය හැක.

43. ජල ජීවී වගාවේදී,
1. ජලයේ pH අගය වැඩි වූ විට, ඇමෝනියා විෂ වීම සිදුවේ.
2. ජලයේ උෂ්ණත්වය අඩු හෝ වැඩි වීම මත්ස්‍යයන්ගේ කායික ක්‍රියා සඳහා බල නොපායි.
3. ජලයේ $O_2$ සාන්ද්‍රණය $3mg/l$ ට වඩා වැඩි විය යුතුය.
4. ජලයේ ඇල්ගේ ගහනය අධික වීම ජලයේ pH අගයට බලපෑමක් ඇති නොකරයි.
5. ජලයේ $NH_4^+$ සාන්ද්‍රණයට වඩා $NH_3$ සාන්ද්‍රණය මත්ස්‍යයන්ට අහිතකරව බලපායි.

44. මෞබ බීජ රකින විසිතුරු මත්ස්‍ය කාණ්ඩය වන්නේ,
1. අවුටාරස්, යෙලෝප්‍රින්ස් හා සර්විලිස්ය.
2. ඩිස්කස්, ඒන්ජල්, ටෙට්රාය.
3. ගෝල්ඩ් ෆිෂ්, ගුරාමි, ටෙට්රාය.
4. ඒන්ජල්, ගෝල්ඩ් ෆිෂ්, ගුරාමිය.
5. ගප්පි, කැට්ෆිෂ්, ස්වෝඩ්ටේල්ය.

45. සමෝච්ච රේඛා පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,
1. ඉතා කලාතුරකින් සමෝච්ච රේඛා එකිනෙකට කැපී පිහිටයි.
2. දඹයකදි (cliff) සමෝච්ච රේඛා එකිනෙකට ඉතා සමීපව පිහිටයි.
3. දළ බෑවුම් සහිත කඳු මුදුනක දි සමෝච්ච රේඛා දුරස්ථව පිහිටයි.
4. තැනිතලාවක දී සමෝච්ච රේඛා ලංලංව පිහිටයි.
5. පොළොව දෙසට උත්තලව පිහිටන V හැඩැති සමෝච්ච රේඛා වැටියක් පෙන්නුම් කරයි.

46. ආහාර සිසිල් පැස්ටරිකරණයට උදාහරණයක් වන්නේ,
1. දුම්ගැසීම 2. ප්‍රබල කිරීම 3. අධි පීඩන සැකසීම
4. ස්පන්දන විදුලි තාපනය 5. විසිරි වියළීම

47. බිත්තර රක්කවීමේ දී සංසේචිත කිකිළි බිත්තර තෝරා ගැනීම සඳහා කැන්ඩ්ලින් උපකරණයෙන් නිරීක්ෂණය කළ යුත්තේ,

1. දින 07 දී ය. 2. දින 12 දී ය. 3. දින 21 දී ය.
4. දින 14 දී ය. 5. දින 05 දී ය.

48. යම් පසක දෘශ්‍ය ඝනත්වය $1.6\ gcm^{-3}$ ද සත්‍ය ඝනත්වය $2.4\ gcm^{-3}$ ද නම් එම පසෙහි සච්ඡිද්‍රතාව වන්නේ,
1. 33% 2. 25% 3. 66% 4. 17% 5. 83%

49. සිව්රෝද ට්‍රැක්ටරයට මෝල් බෝඩ් නගුලක් සවිකිරිම සඳහා භාවිතා කරනුයේ,
1. ඇදුම් දණ්ඩ 2. ඇඳුම් ලක්ෂ්‍යය 3. ඇදුම් කොක්ක
4. ජවගනු දණ්ඩ 5. තුන් පුරුක් ඇඳුම

50. ජල රෝපිත වගා පද්ධතියක බෝග වගාකරනු ලබනුයේ,
1. සිරස් මලුවලය 2. පාංශු මාධ්‍යයකය 3. වගා මළුවකය
4. පෝෂක සහිත ද්‍රව මාධ්‍යයකය 5. නිර්පාංශු ඝන වගා මාධ්‍යයකය.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**Provincial Department of Education - NWP**

| 66 | S | II |
|---|---|---|

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

**First Term Test - Grade 13 - 2019**

විභාග අංකය ............................ ජෛව පද්ධති තාක්ෂණවේදය II කාලය පැය තුනයි

## A කොටස

01) A. ජල ජීවී සම්පත් කර්මාන්තය යටතේ මත්ස්‍ය වගාව ප්‍රධාන වශයෙන් ආහාරමය මත්ස්‍ය වගාව හා විසිතුරු මත්ස්‍ය වගාව ලෙස ක්ෂේත්‍ර දෙකක් ඔස්සේ විහිදී පවතී.

i. විසිතුරු මත්ස්‍ය වගාවේ දී මත්ස්‍ය අභිජනනය කිරීමේ අරමුණු 03 ක් සඳහන් කරන්න.

1. ..........................................................................
2. ..........................................................................
3. .......................................................................... (ල. 3 x 3 = 9)

ii. ආහාරමය මත්ස්‍ය වගාවේ දී හෝර්මෝන භාවිතා කර අභිජනනය සිදු කරයි. එසේ ලබා දෙන හෝමෝන වර්ග 02 සඳහන් කරන්න.

1. ..........................................................................
2. .......................................................................... (ල. 4 x 2 = 8)

iii. හෝර්මෝන භාවිතා කර අභිජනනය කර පැටවුන් ලබා ගන්නා මත්ස්‍ය වර්ග දෙකක් සඳහන් කරන්න.

1. ............................................ 2. ............................................

(ල. 4 x 2= 8)

B. බෝග වගාව සඳහා සරුපස වැදගත් වේ.

i. සරුපසක් තුලින් දෘෂ්‍යමාන වන ලක්ෂණ 02 සඳහන් කරන්න. (ල. 2 x 2)

1. ............................................ 2. ............................................

ii. ජෛව පද්ධතිය තුල පාංශු ක්ෂුද්‍රජීවීන්ගේ වැදගත්කම් 02 ක් සඳහන් කරන්න.

1. ..........................................................................
2 ..........................................................................

(ල. 3 x 2)

iii. පාංශු ජීවීන් යොදාගෙන බිහිකළ හැකි කෘෂිකාර්මිකව වැදගත් නිෂ්පාදන 02 නම් කරන්න.

1. ............................................ 2. ............................................

(ල. 3 x 2)

C. i. ස්වයංක්‍රිය කාලගුණික මධ්‍යස්ථානයක තිබිය යුතු අත්‍යවශ්‍ය අංග 03 සඳහන් කරන්න.

1. ............................................................ 2. ............................................................

3. ............................................................ (ල. 2 x 3)

D. ඉහළ උෂ්ණත්ව තත්ත්වවලට භාජනය කිරීම ආහාර පරිරක්ෂණය සිදු කරන එක් ක්‍රමයකි.

i. පරිරක්ෂණය සඳහා ඉහළ උෂ්ණත්ව යොදා ගැනෙන ප්‍රධාන තාක්ෂණික ශිල්ප ක්‍රම 02 සඳහන් කරන්න.

1. ............................................................ 2. ............................................................

(ල. 3 x 3)

ii. ඉහත සඳහන් තාක්ෂණික ශිල්ප ක්‍රම සිදු කරනු ලබන උෂ්ණත්ව හා කාල පරාස සඳහන් කරන්න.

| | උෂ්ණත්ව පරාස | කාල පරාස |
|---|---|---|
| ජීවානුහරණය | | |
| පැස්ටරීකරණය HTST | | |
| LTLT | | |
| ක්ෂණික | | |

(ල. 2 x 4)

iii. ශීත වියලනයේ මූලධර්මය සඳහන් කරන්න.

................................................................................................................................(ල. 2 x 1)

iv. ශිත වියළීම මගින් පරිරක්ෂණය කළ හැකි ආහාර වර්ග දෙකක් සඳහන් කරන්න.

1. ..................................................... 2. ..................................................... (ල. 1 x 2)

v. පැසවීම මගින් ආහාර පරිරක්ෂණය සිදුකරන ප්‍රධාන ආකාර සඳහන් කරන්න.

1. ............................................................ 2. ............................................................

3. ............................................................ (ල. 1 x 3)

vi. ලැක්ටික් අම්ලය පැසවීම මගින් නිෂ්පාදනය කළ හැකි ආහාර වර්ග 02 සඳහන් කරන්න.

1. ..................................................... 2. ..................................................... (ල. 2 x 2)

02. A. ඉඩමක් සැළසුම් කිරීමේ දී බිම් මැනුම හා මට්ටම් ගැනීම, එම ඉඩමේ භූමි හලදායිතාව ඉහළ දැමීමට හේතු වේ.

i. මට්ටම් ගැනීමක දී ලද BS (පසු දර්ශන) හා FS (පෙර දර්ශන) මිනුම් පහත රූප සටහනේ දක්වා ඇත.




දී ඇති රූප සටහන භාවිතයෙන් පහත දෑ ගණනය කරන්න.

(1) B හි උච්චත්වය ....................................................................................................

(2) C හි උච්චත්වය ....................................................................................................

(3) B හා C අතර උච්චත්ව වෙනස ........................................................................... (ල. 3 x 3)

ii. සිතියම් නිර්මාණයේ දී පරිමාණය දක්වන ආකාර 03 සඳහන් කරන්න.

1. ................................................................ 2. ................................................................

3. ................................................................ (ල. 3 x 3)

iii. සිතියමක් සඳහා සුදුසු පරිමාණයක් තෝරා ගැනීමේ දී සැළකිය යුතු සාධක 02 නම් කරන්න.

1. ................................................................ 2. ................................................................

(ල. 2x2)

B. ජලයේ ගුණාත්මය ඇගයීමේදී ජලයේ අවලම්බිත මුළු ඝන ද්‍රව්‍ය මැනීම ඉතා වැදගත් වේ.

i. ජලයේ අවලම්බිත ඝන ද්‍රව්‍ය සඳහා දායක වන ද්‍රව්‍ය 03 සඳහන් කරන්න.

1. ................................................................ 2. ................................................................

3. ................................................................ (ල. 3 x 3)

ii. ජලයේ අවලම්හිත ඝනද්‍රව්‍ය ප්‍රමාණය ජලයේ කවර ගුණාංගයට බලපායිද?

................................................................................................................................

(ල. 2 x 1)

iii. මල අපද්‍රව්‍ය සහිත ජලය පරිහරණයේ දී ප්‍රධාන වශයෙන් සැළකිලිමත් විය යුතු කරුණක් සඳහන් කරන්න.

................................................................................................................ (ල. 4 x 1)

iv. විවිධ ජෛව පද්ධති කෙරෙහි ජල දූෂණයේ බලපෑම නිසා වර්තමානයේ ගැටළු කාරී තත්ත්වයට මුහුණ දීමට සිදු වී ඇත. ජල දූෂණය සඳහා හේතුවන දූෂණ කාරක 04 සඳහන් කරන්න.

1. ................................................................ 2. ................................................................

3. ................................................................ 4. ................................................................

(ල. 2 x 4)

C. ගොවිපල යාන්ත්‍රීකරණය සඳහා වර්තමානයේ බහුලවම ද්විරෝද හා සිව්රෝද ට්‍රැක්ටර් භාවිතා කෙරේ.

i. පහත රූප සටහනේ දැක්වෙන්නේ සිව්රෝද ට්‍රැක්ටරයක රූපසටහනකි. එහි A හා B කොටස් හඳුනාගෙන ඒවායේ කාර්යය දක්වන්න.




| | කොටස | කාර්යය |
|---|---|---|
| A | | |
| B | | |

(ල. 2 x 4)

ii. පහත අවස්ථා සඳහා සිව්රෝද ට්‍රැක්ටරයකට සවි කළ හැකි බිම් සැකසුම් උපකරණ සඳහන් කරන්න.

a) ගල් මුල් සහිත රළු භූමියක සී සෑම - ................................................................

b) පසේ තද යටිපස ස්ථරය (Hard Pan) බිඳ දැමීම - ................................................................

(ල. 2 x 2)

D. නව ආහාර සූත්‍රණයේ දී ඉන්ද්‍රිය ගෝචර ඇගයීම වැදගත් කාර්යයක් ඉටු කරයි.

i. ආහාරයක ඉන්ද්‍රිය ගෝචර ඇගයීම පරීක්‍ෂා කළ යුතු අවස්ථා 02 සඳහන් කරන්න. (ල. 2 x 2)

1. ..........

2. ..........

ii. ඉන්ද්‍රිය ගෝචරතාව ඇගයීම සඳහා යොදා ගන්නා පරීක්‍ෂණාගාරය තුල තිබිය යුතු තත්ත්ව 02 සඳහන් කරන්න (ල. 2 x 2)

1. ..........

2. ..........

iii. ආහාර සැකසීම සඳහා නව ප්‍රවණතා භාවිතයේ වාසි දෙකක් සඳහන් කරන්න. (ල. 2 x 2)

1. ..........

2. ..........

E. i. ආහාරයට ගත හැකි දැව නොවන වනජ නිෂ්පාදන තුනක් නම් කරන්න.

1. .......... 2. ..........

3. .......... (ල. 2 x 3)

03. A. වාණිජ කිරි නිෂ්පාදනයේ පළමු පියවර කිරි එකතු කිරීමයි.

i. වර්තමානයේ ශ්‍රී ලංකාවේ කිරි එකතු කිරීමේ මධ්‍යස්ථායකදී උපකරණ පිරිසිදු කිරීමේ යාන්ත්‍රණයේ පියවර 04 ක් දක්වන්න. (ල. 4 x 4)

1. ..........

2. ..........

3. ..........

4. ..........

ii. නැවුම් කිරි සඳහා පහත දැක්වෙන ගුණාත්මක පරීක්‍ෂා මගින් තහවුරු කළ හැකි නිගමන සඳහන් කරන්න.

| | ගුණාත්මක පරීක්‍ෂාව | නිගමනය |
|---|---|---|
| 1 | කිරිවල මේද ගෝලිකා වල හැඩය | |
| 2 | ඇල්කොහොල් පරීක්‍ෂාව | |
| 3 | කිරි රත් කිරීමේ දී කැටි ගැසීම | |

(ල. 4 x 3)

B. i. ජල සම්පාදන පද්ධතියක කොටස් පහත රූපසටහනේ දැක්වේ. එහි A-F දක්වා නම් කළ කොටස් හඳුනාගෙන සඳහන් කරන්න.




A .......... B ..........

C .......... D ..........

E .......... F ..........(ල. 2 x 6)

C. වී නිෂ්පාදනයේ දී, පසු අස්වනු ක්‍රියාකාරකම් මත තැම්බූ සහල්වල ගුණාත්මය රැඳී පවතී.

i. වසරකට වැඩි කාල සීමාවක්, ආහාර සඳහා වී ගබඩා කිරීමේ දී පැවතිය යුතු තෙතමන ප්‍රතිශතය සඳහන් කරන්න.

........................................................................................................................... (ල. 3)

ii. තැම්බූ සහල්වල දුගඳ ඉවත් කිරීම සඳහා ගත යුතු පූර්ව ක්‍රියාකාරකම සඳහන් කරන්න.

........................................................................................................................... (ල. 3 x 1)

D. i. ශ්‍රී ලංකාවේ වාණිජ වශයෙන් පටක රෝපණය යොදා ගනිමින් පැළ ලබා ගන්නා ශාක සඳහා උදාහරණ 03 දක්වන්න.

1. ..................................................................................................................................

2. ..................................................................................................................................

3. ........................................................................................................................... (ල. 3 x 2)

ii. තවාන් පැල සඳහා තත්ව සහතිකයක් ලබා ගැනීමට තවාන් පැල වලතිබිය යුතු ගුණාත්මක ප්‍රමිති 04 සඳහන් කරන්න.

1. ..................................................................................................................................

2. ..................................................................................................................................

3. ..................................................................................................................................

4. ........................................................................................................................... (ල. 3 x 4)

E. ප්‍රදේශයට ගැළපෙන පරිදි ආරක්ෂිත ගෘහයන්හි වහලය ඉදි කිරීම මඟින්, ප්‍රශස්ත පරිසර තත්ත්ව යාමනය කළ හැකිය.

i. පහත දක්වා ඇති ආරක්ෂිත ගෘහ ආකාර නම් කර, ඒවා වඩාත් උචිත ප්‍රදේශ සඳහන් කරන්න



(1) (2) (3)

| ගෘහ ආකාරය | ප්‍රදේශය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |

(ල. 2 x 6)

ii. ආරක්ෂිත ගෘහ තුල උෂ්ණත්වය අඩු වූ විට එය යාමනය සඳහා යොදා ගත හැකි ශිල්ප ක්‍රම 03 සඳහන් කරන්න.

1. ..................................................................................................................................

2. ..................................................................................................................................

3. ..................................................................................................................................

(ල. 3 x 1)

04. A.i. කුකුළු ගොවිපළක් අළුතින් ආරම්භ කිරීමේ දී දිනක් වයසැති කුකුළු පැටවුන් තෝරා ගැනීමෙන් අත්වන වාසි 02ක් සඳහන් කරන්න.

1. ..................................................................................................................................

2 ........................................................................................................................... (ල. 3 x 2)

ii. වාණිජව කුකුළු පැටවු බිහිකර ගැනීම සඳහා භාවිතා වන බිත්තර රක්කවන ආකාර දෙක නම් කර ඒවායේ බිත්තර තැන්පත් කරන ආකාරය සඳහන් කරන්න. (ල. 3 x 4)

| | බිත්තර රක්කවන ආකාර | බිත්තර තැන්පත් කරන ආකාර |
|---|---|---|
| 1 | | |
| 2 | | |

iii. බිත්තර රක්කවනයක් තුල පවත්වා ගත යුතු උෂ්ණත්වය කොපමණද?

1. ............................................................................................................................ (ල. 1 x 3)

iv. කිරිවල මේද ප්‍රතිශතය ගර්බර් ක්‍රමයෙන් සෙවීමේ දී අවසාන පාඨාංකය ලබා ගැනීම සඳහා ගර්බර් නලය තුල තිබිය යුතු උෂ්ණත්වය කොපමණ වේද?

1. ............................................................................................................................ (ල. 3 x 1)

B. එකම ගසේ කඳේ මැද සිට පිටතට යන විට ඝනත්වය වැඩිවන අතර ගසේ මුල සිට ඉහළට යන විට ඝනත්වය අඩුවේ.

(i) දැව වල ඝනත්වය වෙනස්වීමට බලපාන සාධක 03 ක් සඳහන් කරන්න.

1. ............................................................................................................................
2. ............................................................................................................................
3. ............................................................................................................................ (ල. 3 x 3)

C. වර්තමානයේ සකස් කළ ආහාර මිලදී ගැනීමට බොහෝ දෙනා පෙළඹී ඇත.

i) ආහාර සැකසීමේ දී කෘත්‍රිම වර්ණක එකතු කිරීම සම්පූර්ණයෙන් තහනම් කර ඇති ආහාර 03සඳහන් කරන්න.

1. ............................................................................................................................
2. ............................................................................................................................
3. ............................................................................................................................ (ල. 3 x 3)

ii) විවිධාංගිකරණය කරන ලද ආහාර නිෂ්පාදනවල වාසි 02 සඳහන් කරන්න.

1. ............................................................................................................................
2. ............................................................................................................................ (ල. 3 x 2)

iii) ආහාරයක ජීව කාලය කෙරෙහි බලපාන සාධක 03 ක් සඳහන් කරන්න.

1. ............................................................................................................................
2. ............................................................................................................................
3. ............................................................................................................................ (ල. 2 x 3)

iv) ආහාර ලේබලයක අන්තර්ගත විය යුතු කරුණු 02 ක් සඳහන් කරන්න.

1. ............................................................................................................................
2. ............................................................................................................................ (ල. 2 x 2)

D. i. අතින් ක්‍රියා කරන ද්‍රව ඉසින යන්ත්‍ර ආකාර 02 සඳහන් කරන්න. (ල. 3 x 2)

1. ....................................................................... 2. .......................................................................

ii. දියර ඉසින යන්ත්‍රයක නොසලයේ ක්‍රියාකාරීත්වය සඳහන් කරන්න. (ල. 1 x 3)

............................................................................................................................................

E. i. එළවළු පළතුරු ශිත දාමය තුළ හැසිරවීමේ දී අස්වනු ක්ෂේත්‍රයෙන් ඉවත් කළ විගස සිදු කළ යුතු අනිවාර්ය ක්‍රියාකාරකම සඳහන් කරන්න.

1. ............................................................................................................................ (ල. 4)

ii. ඉහත ක්‍රියාකාරකමෙහි වැදගත්කම සඳහන් කරන්න.

............................................................................................................................................ (ල. 4)

**පළමු වාර පරීක්ෂණය - 2019**

**ජෛව පද්ධති තාක්ෂණවේදය - 13 ශ්‍රේණිය**

**II කොටස - B කොටස**

- **ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.**

05) i. අධික සුළං තත්ත්වයන් ජෛව පද්ධතිවලට ඇති කරන බලපෑම් පිළිබඳ සාකච්ඡා කරන්න. (ල. 100)

ii. පටක රෝපණයේ ප්‍රධාන භාවිතයන් පිළිබඳ විස්තර කරන්න. (ල. 100)

iii. තත්ත්ව කළමනාකරණ පද්ධතියක් ලෙස අවධි පාලන ලක්ෂය ඇසුරින් අනතුරු විශ්ලේෂණය පියවර විස්තර කරන්න. (ල. 100)

06) i. මත්ස්‍ය පොකුණක ජල කළමනාකරනය සඳහා අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග විස්තර කරන්න. (ල. 100)

ii. සෞඛ්‍ය ආරක්ෂිත ආහාර වේලක් සැකසීමේ දී ආහාරයට අනතුරු විය හැකි මූලික ආපදා පැහැදිලි කරන්න. (ල. 100)

iii. පසක ආම්ලිකතාව වර්ධනය වීමේ හේතු පැහැදිලි කරන්න. (ල. 100)

07) i. සුදුසු රූපසටහනක් යොදා ගනිමින් පිස්ටන් ආකාර නැප්සැක් දියර ඉසින යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය පැහැදිලි කරන්න. (ල. 100)

ii. භූ ජල පුනරාරෝපණය වැඩිකරගත හැකි ක්‍රියාමාර්ග විස්තර කරන්න. (ල. 100)

iii. පාලිත තත්ත්ව යටතේ බෝග වගාවේ වැදගත්කම විස්තර කරන්න. (ල. 100)

08) i. දම්වැල් බිම් මැනිම සීමාකාරී වන අවස්ථා විස්තර කරන්න. (ල. 100)

ii. බිත්තර ආශ්‍රිත නිෂ්පාදන සඳහා යොදා ගන්නා බිත්තරවල ගුණාත්මකබව පරීක්ෂා කරන ආකාරය විස්තර කරන්න. (ල. 100)

iii. ආහාර ඇසුරුම්කරණයේ අරමුණු පැහැදිලි කරන්න. (ල. 100)

09) i. ජෛව පද්ධතියක ජල දූෂණයේ බලපෑම විස්තර කරන්න. (ල. 100)

ii. පොළොවේ ලක්ෂ්‍ය 02 අතර පැතිකඩ මට්ටම් ගැනීමේ දී සිදුවිය හැකි දෝෂ පිළිබඳ විස්තර කරන්න. (ල. 100)

iii. කේන්ද්‍රාපසාරී ජල පොම්පයක් තෝරා ගනීමේ දී සැලකිය යුතු සාධක විස්තර කරන්න. (ල. 100)

10) i. ගුණාත්මක මත්ස්‍යය අස්වනු හඳුනා ගැනීමට යොදා ගත හැකි ලක්ෂණ පහදන්න. (ල. 100)

ii. පහත සඳහන් බිම සැකසුම් උපකරණවල විශේෂ ලක්ෂණ හා භාවිතය පිළිබඳව විස්තර කරන්න.
(a) මෝල්බෝඩ් නගුල (b) කොකු නගුල (a) රොටොවේටරය (ල. 100)

iii. අපමිශ්‍රණය වූ කිරි හඳුනාගැනීමේ පරීක්ෂා විස්තර කරන්න. (ල. 100)

# ජෛව පද්ධති තාක්ෂණවේදය
## පළමු වාර පරීක්ෂණය 13 ශ්‍රේණිය - 2019
## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1) | 4 | 11) | 4 | 21) | 2 | 31) | 2 | 41) | 4 |
| 2) | 3 | 12) | 2 | 22) | 1 | 32) | 3 | 42) | 5 |
| 3) | 2 | 13) | 1 | 23) | 5 | 33) | 1 | 43) | 5 |
| 4) | 2 | 14) | 1 | 24) | 4 | 34) | 3 | 44) | 1 |
